# ශ්‍රී ලංකා
# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ
# පාර්ලිමේන්තුව

---

# 1982 අංක 14 දරන
# මුදල් (සංශෝධන) පනත

---

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1982 මාර්තු මස 26 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.


ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිල දී ලබාගත හැක

මිල : ශත 35 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1982 අංක 14 දරන මුදල් (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 1982 මාර්තු මස 25 වන දින.]

එල්. ඩී.—ඕ. 5/82.

**1963 අංක 11 දරන මුදල් පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :—

**1.** මේ පනත 1982 අංක 14 දරන මුදල් (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. — ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1963 අංක 11 දරන මුදල් පනතෙහි 59 වන වගන්තිය ඉක්බිතිව ම පහත දැක්වෙන අලුත් වගන්තිය ඇතුළත් කරනු ලබන අතර එය එහි 59අ වගන්තිය ලෙස බලපැවැත්විය යුතු ය :— — 1963 අංක 11 දරන පනතෙහි 59අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"යම් ඉඩමක අයිතිය පවරනු ලබන පුරවැසියන් නොවන තැනැත්තන් විසින් පැවරීමේ සාධන පත්‍රයෙහි ප්‍රකාශනයක් කොට අත්සන් තැබිය යුතු බව.

59අ. ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන සහ බදු ගෙවීමට යටත් යම් තැනැත්තකු වෙත යම් ඉඩමක අයිතිය පවරනු ලබන අවස්ථාවක දී, ඒ තැනැත්තා විසින් ඒ පැවරීම කරන සාධන පත්‍රයෙහි අග තමා ශ්‍රී ලංකාවේ පුරවැසියකු නොවන බවට ප්‍රකාශනයක් කොට අත්සන් කළ යුතු ය. ඒ සාධන පත්‍රය සහතික කරන නොතාරිස්වරයා විසින් ප්‍රකාශනය කරන තැනැත්තාගේ අත්සන සහතික කළ යුතු ය.".

**3.** ප්‍රධාන ප්‍රඥප්තියෙහි 60 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :— — ප්‍රධාන ප්‍රඥප්තියෙහි 60 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) ඒ වගන්තියෙහි (1) වන උපවගන්තිය ඉවත් කොට, ඒ වෙනුවට පහත දැක්වෙන උපවගන්තිය ආදේශ කිරීමෙන් :—

"(1) යම් ඉඩමක අයිතිය යම් තැනැත්තකුට පැවරීම කරන සාධන පත්‍රයක් ලියාපදිංචි කිරීම සඳහා ලේඛන ලියාපදිංචි කිරීමේ ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව, ඉදිරිපත් කරනු ලැබූ අවස්ථාවක දී, ඉඩම් රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ ආඥාපනතේ විධිවිධානවලට යටත්ව, ඒ සාධන පත්‍රය ලියාපදිංචි කළ යුතු ය :

එසේ වුව ද, 59අ වගන්තියෙහි සඳහන් කරනු ලැබ ඇති ප්‍රකාශනයක් ඒ සාධන පත්‍රයෙහි අඩංගුව තිබේ නම්, ඒ සාධන පත්‍රය මගින් කරන ලද පැවරීම සම්බන්ධයෙන් ගෙවිය යුතු බද්ද තමා වෙත ගෙවනු ලැබ තිබේ නම් හැර සහ ගෙවනු ලබන තුරු, රෙජිස්ට්‍රාර්වරයා විසින් ඒ සාධන පත්‍රය ලියාපදිංචි කිරීම ප්‍රතික්ෂේප කළ යුතු ය.";

1—ඒ 61737—15,475 (82/03)

(2) ඒ වගන්තියේ (3) වන උපවගන්තියෙහි "(1) වන උපවගන්තියේ හෝ (2) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම් යෙදෙන කවර විටක වුව ද ඒ වෙනුවට "(2) වන උපවගන්තියේ" යන වචන සහ ඉලක්කම ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියෙහි 64 වන වගන්තිය සංශෝධනය කිරීම.

4. ප්‍රධාන ප්‍රඥප්තියෙහි 64 වන වගන්තිය අගට පහත දැක්වෙන අලුත් වගන්තිය එකතු කිරීමෙන්, ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

"(4) යම් ඉඩමක අයිතිය තමා වෙත පැවරීම කරන සාධන පත්‍රයක ප්‍රකාශනයක් කොට අත්සන් කිරීම 59අ වගන්තිය මගින් නියම කරනු ලැබ ඇති නමුත් ඒ ප්‍රකාශනය කොට අත්සන් කිරීම පැහැර හරින යම් තැනැත්තකු මේ පනතේ මේ කොටස යටතේ වරදක් කරන අතර මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පවත්වනු ලබන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට රුපියල් එක් ලක්ෂයක් නොඉක්මවන දඩයකට හෝ වර්ෂ දෙකක් නොඉක්මවන කාලසීමාවකට බන්ධනාගාරගත කිරීමට හෝ ඒ දඩය සහ බන්ධනාගාරගත කිරීම යන දඬුවම් දෙකටම සහ ඒ සෑම අවස්ථාවක දීම ඒ සාධන පත්‍රය මගින් පවරනු ලැබූ ඉඩමේ වටිනාකම මෙන් දෙගුණයකට සමාන අතිරේක දඩ මුදලකට ද ඔහු යටත් විය යුතු ය.

(5) පුද්ගල මණ්ඩලයක් විසින් (4) වන උපවගන්තිය යටතේ වූ වරදක් කරනු ලැබූ අවස්ථාවක දී—

(අ) ඒ පුද්ගල මණ්ඩලය සංස්ථාගත මණ්ඩලයක් නම්, ඒ වරද කරනු ලැබූ වේලාවේ දී, ඒ සංස්ථාගත මණ්ඩලයේ අධ්‍යක්ෂවරයකු, කළමනාකරුවකු, ලේකම්වරයකු හෝ එවැනි වෙනත් නිලධරයකුව සිටි සෑම තැනැත්තකුම ; හෝ

(ආ) ඒ පුද්ගල මණ්ඩලය ව්‍යාපාර ආයතනයක් නම්, වරද කරනු ලැබූ වේලාවේ දී ඒ ව්‍යාපාර ආයතනයේ හවුල්කරුවන්ව සිටි සෑම තැනැත්තකුම

තමා නොදැනුවත්ව හෝ තමාගේ ගුප්තානුකූලතාව නොමැතිව ඒ වරද කර ඇති බවත්, තම කර්තව්‍යවල ස්වභාවය හා එළඹ තිබුණු සියලු අවස්ථාගත කරුණු ගැන සලකා බලන විට තමා විසින් කළ යුතුව තිබූ පරිදි, ඒ වරද කිරීම වැළැක්වීම පිණිස තමා විසින් සියලු නිසි අනලස්භාවයෙන් යුතුව ක්‍රියා කළ බවත් ඔප්පු කළහොත් මිස, ඒ තැනැත්තා වරදක් කර ඇති ලෙස සලකනු ලැබිය යුතු ය.".

පාර්ලිමේන්තුවේ පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 150 කි. (විදේශීය) රු. 200 කි. කොළඹ 1, තැ. පෙ. අංක 500, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබා ගත හැකිය.